

# අඳුන් සිහින

10

හේමමාලා හේරත් ලියන නවකතාව

මෙතෙක් කතාව :

*රිදීමා, මහීකා, රුචිරා සහ අමා, ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් කරා පැමිණි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවෝය. රිදීමා, තමා දැකපුරුදු තරුණයෙකු නිතර දකී. එහෙත් ඔහු කවුදැයි කීමට තරම් මතකයක් ඇයට නැත. වෛද්‍ය ශිෂ්‍යාවක වන අමා, ඇයව මෝහනය කරනා මුත්, රිදීමාට ඔහු හා සම්බන්ධ අතීතයක් කරා යාගත නොහැකි වේ. මේ අතර මහීකාගේ පෙම්වතා වන අජයගේ ළඟම මිතුරු දිනූෂගේ සිතෙහිද රිදීමා ගැන ආදරයක් හටගනී. හටගනී. නිශ්ක නැමැති තරුණයා පිළිබඳව රිදීමාගේ සිතෙහි ඇත්තේ කුමන හැඟීමක්දැයි යහළුවන් සියල්ලන්ටම ඇත්තේ ගැටළුවකි. රිදීමාද මින් පීඩා විඳී. අවසන මෙම රහස කුමක්දැයි සොයා බලා, ඒ විසඳා ගැනීම සඳහා, සැවොම ලංකාව බලා පියාසර කරති.*

**එතැන් සිට:**

"පොඩ්ඩක් ඔහොම හිටහන් !" රිදීමා වහා, ගං ඉවුරෙහි වූ කුඹුක් ගසකට මුවාව සිට ගත්තාය.

"ඇයි සුදුබේබි ? " පිංචිගේ දෑසෙහිවූයේ, ප්‍රශ්ණාර්ථයෙකි. මුවද මඳක් විවර වූයේය. රිදීමා තම දබරැඟිල්ල දෙතොල මත තබා, නිහඬ වන්නැයි ඇයට සංඥා කළාය. නිල්, රතු කොටු සරමක් හා සුදු කමිසයක් හැඳගත්තෙකු නිශ්ක හා කතා කරනු පිංචිටද පෙණුනේය.

රිදීමා ඇයත් ඇදගෙන අසල වූ අඩක් එළිපෙහෙළි කරනු ලැබූ හේනක් වෙත දිව ගියාය. පය පැටලුණු පිංචි කෙල්ල වැටෙන්නට ගියේ වරක් දෙවරක් නොවේ. රිදීමා පසෙක වූ වියලි තණ ගොල්ලක් මතට ඇය තල්ලු කළාය.

"පිංචියේ ! උඹ අද ඇත්ත කියනකල් අපි මෙතනින් හෙල්ලෙන්නේ නැහැ....."

පිංචිගේ විසල් දෑස, තවත් විශාල වූයේය.

"මොනවද බේබි ?"

රිදීමා, හරිබරි ගැසී පිංචි අසලින් හිඳගත්තාය.

"උඹ සුදු මැණිකේ එක්ක නිශ්ක බලන්න ගං ඉවුරට ආවද ? නැද්ද ?"
"මම ....." පිංචි කෙල්ල කට අයා යමක් කීමට තැනුවාය.

"කෙලින් උත්තරයක් දීපන්. ආවද ? නැද්ද ?" රිදීමා ඇයට බාධා කළාය.

"මම කලිනුත් කීවා. ඇත්ත කියපන් !"
"නෑ....." පිංචිගේ හිස දෙපසට සැලිණි.
"හොඳයි.... උඹ ඔය සුදු මැණිකේ කියන්නේ මටද ?"

එවර නම්, පිංචිගේ මුවගෙහි සිනාවක් ඇඳී ගියේය.

"නෑ....."
සිය හදවත දාගන යන්නාක් මෙන් දැනුණොත්, රිදීමා මොහොතකට දෑස් පියා ගත්තාය.
"කවුද සුදු මැණිකේ කියන්නේ ?"
"බේබි නෙවේ......"

ඇය කියන දෑ තේරුම් ගැනීමට හොඳින් සවන්දීමට සිදුවූ තරම් සිහින් හඬකිනි, පිංචි කතා කළේ.

"එහෙනම් කවුද ?"

"බේබි තමයි !"

රිදීමාගේ හදවත යළිත් දා ගියේය.

"මොනවද උඹ මේ කියන අන්ඩර දෙමළ..... බේබි නෙමෙයි.... බේබි තමයි !" රිදීමාගේ හඬ උස් වූයේය.
"සුදු මැණිකේ බේබි වගේමයි. ඒත් බේබි නෙමෙයි....."

රිදීමා පසෙක වූ ගසකට හේත්තු වූවාය. ගසේ පිපී තිබූ කුමක්දෝ නොහඳුනනා මලකින් හැමූ තද සුගන්ධය, තම හිස කරකවන්නාක් මෙන් ඇයට දැනුණෝය.

"පිංචියේ මට තේරෙන්නේ නැහැ...." ඈ මඳ වේලාවකට පසු පැවසුවාය.
"මටත් තේරෙන්නේ නෑ බේබි..." පිංචිද කීවාය.
"සුදු බේබි.... සුදු බේබි...." ඒ සුබරත්න මැණිකේගේ හඬය.

"අම්මා හොයනවද දැන්නෑ. සුබේ කෑගහන්නේ ඒක වෙන්නැති." රිදීමා වහා නැගිට්ටාය.
"උඹ මේ ගැන කාටවත් කියනවා එහෙම නෙමේ !"

පිංචි කෙල්ල හිස සැලුවාය.

"අද රෑට උඹ නිදන්නේ-න් මගේ කාමරේ තේරුණාද ?"
පිංචි වහා දුවන්නට පටන් ගත්තාය.
"අපි එනෝ !"

රිදීමාද, ඇය පසුපස ඉගිල්ලුණාය. ඇය මෙම දර්ශණය, කීවතාවක් සිහි-නෙන් දකින්නට ඇත්ද ?



"මේ කෙල්ල සුදු බේබිව අර කැලේ මොන එහෙකට ඇදගෙන ගියාද ?" සුබරත්න මැණිකේ පිංචිට සැර වූවාය.
"බේබිගේ මූණත් එක්ක රතු වෙලා. යන්න ගිහින් මූණ කට හෝදගෙන එන්ට......"

රිදීමා මූණ සෝදාගෙන එන විටත් අම්මා පෙනෙන්නට නොසිටියාය.

"ලොකු මැණිකේ ගියා පොඩ්ඩක් ඇලවෙන්ට ! මේ දවස්වල ටිකක් සනීප මදි නෙව...."

සුබරත්න මැණිකේ ඔසවාගෙන පැමිණි තේ බන්දේසිය, කෑම මේසය මත තැබුවාය.

රිදීමා, අටපට්ටමක හැඩයට කපා තිබූ අළුවා කැබැල්ලක් අතට ගත්තාය. හීන් රන් වළලු දැමූ අතකින් අලුවා කැබැල්ලක් ඩැහැ ගන්නවා ඇගේ මනසෙහි ඇඳී, නොපෙනී ගියේය.

"ඇයි සුදු බේබි !"

"නෑ.... මගේ අතේ තිබුණු රත්තරන් වළලු දෙක කෝ කියලා කල්පනා කළා..."



මල් වැටුණු කෝප්පයකට තේ වත් කරමින් සිටි සුබරත්න මැණිකේ අතින් තේ ඩිංගිත්තක්, මේසය මතට හැලුණේය.

"මොන රත්තරන් වළලුද ?"

"ඇයි අර හීනි රන් වළලු දෙක ?"

සුබරත්න මැණිකේ කතා නොකොට පුවාලු ගෙඩියක් කඩා, රිදීමාගේ පිඟානෙහි තැබුවාය.

"අර එන සෙනගට රෑ කෑම තනන්නත් තියනවනේ. මං යඥ්ඥදං උයනගේ පැත්තට...."

රිදීමා අළුවා කැබැල්ලෙහි රස වින්දාය. රන්වළලු කී හැටියේ සුබරත්න මැණිකේ තිගැස්සුණාවත්ද ?

තදට ගෙතූ රැලි වැටුණු කොන්ඩා කරල් දෙකත්, ඒ ගීතවත් සිනා හඬත්, රන් වළලු ගැටනා හඬත් ඇයට ඇසී, යළි නෑසී ගියේය.

"කවුද මේ සුදු මැණිකේ ?" ඈ තමන්ගෙන්ම අසා ගත්තාය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

"අපි මේ අහන්නේ මේ ගමේ ගෑනු ළමයෙක්, ගඟේ ගහගෙන ගිහින් මළාද කියනෙක විතරයි." අජය, කුඩා කඩයේ එල්ලෙමින් තිබූ, කෙහෙල් කැනෙන් ගෙඩියක් කඩා ගත්තේය. අනතුරුව එය කටට දෙකට ගිල දැමුවේය. මහීකා, අමා සහ නදින් උන්නේ වාහනය තුලය. අජය කඩයට ගොඩවැදුණෝ දිනූෂ සමගිනි. කඩ හිමියා බැගෑපත් ලෙස දිනූෂ දෙසත්, අජය දෙසත් මාරුවෙන් මාරුවට බැලුවේය.

"මම දන්නේ නැහැ ආයිබොවං ! මම මේ ගමට පිටින් ආව ඇත්තෙක් "

අජය තවත් කෙසෙල් ගෙඩියක් කඩා ගත්තේය.

"උඹ හරියට වඳුරෙක් වගේ නේ බං !" දිනූෂ අජයට පැවසීය. "ඕක ටිකක් හෙමින් කාහන්...... අර අසරණයා උඹට බයවෙලා ඉන්නේ"
"අපි මේ රහස විසඳන්නේ කොහොමද, ගමේ කිසිම කෙනෙකුගේ සහයෝගයක් නැතිව ?"

අජය, කෙසෙල් ලෙල්ල අසල වූ හිස් බක්කියකට විසි කළේය.

"කීයද මුදලාලි......"

අසරණයා හිස කැසීය. අජය රුපියල් සීයේ නෝට්ටු දෙකක් මේසය මතට දැමුවේය.

"මාරු ඕනේ නැහැ. තමුන් තියා ගන්නවා....."

ඔහුගේ බැගෑපත් සිනහවත්, දෙකට නැමුණු කො-න්දත් දුටු අජයට සිතුණේ හොඳවැයින් දෙකක් අනින්නටය. ගම්වල මිනිසුන් මෙතරම් නෝංපල්ද ? ඔවුන්ට කොන්දක් ඇත්තේම නැද්ද ? ගඟේ ගසාගෙන ගියා යැයි කියන ගැහැනු ළමයා ගැන කිසිදු තොරතුරක්, මොවුන්ගෙන් ගත නොහැක්කේ ඇයි ?...."

"හවසට පොලිසිය පැත්තේ ගිහින් බලන්න